


# එල්.එල්.ආර්.සී වාර්තාව පිළිබඳ මත විමසුමක්

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් පිරිසකගේ හා දැනුම්වත් කිරීමේ වැඩමුළු වලට සහභාගී වූවන්ගේ අදහස් ඇසුරෙනි

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# එල්.එල්.ආර්.සී
# වාර්තාව පිළිබඳ
# මත විමසුමක්

(උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම ඉදිරියේ සාක්ෂි දුන්
පිරිසකගේ හා දැනුම්වත් කිරීමේ වැඩමුළු වලට සහභාගි වූවන්ගේ
අදහස් ඇසුරෙනි)

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

ISBN : *978-955-4746-04-6*
**ප්‍රථම මුද්‍රණය** : *අප්‍රේල් 2013*
**මුද්‍රණය** : *ග්ලෝබ් ප්‍රින්ටිං වර්ක්ස් : 011-2689259*
**පරිගණක සැකැස්ම** : *කමලාදේවි සසිවන්ද්‍රන්*

Friedrich Naumann STIFTUNG FÜR DIE FREIHEIT

මෙම ප්‍රකාශය එළිදැක්වූ ලබන්නේ ෆෙඩ්‍රික් නියුමාන් ස්ටිෆ්ටුංග් (FNF) ආයතනය සමග හවුල්කාරිත්වයෙනි. පදනමෙහි වැඩකටයුතු කේන්ද්‍රගත වන්නේ නිදහස සහ වගකිවයුතු බව පිළිබඳ වූ හරයාත්මක ඇගයීම් මතය. තම ව්‍යාපෘති ඔස්සේ ෆෙඩ්‍රික් නියුමාන් ස්ටිෆ්ටුංග් (FNF) ආයතනය විසින් සියලු ජනතාවන්ට නිදහසේ, මානව ගරුත්වයෙන් යුතුව හා සාමයෙන් ජීවත් විය හැකි ලෝකයක් නිර්මාණය කිරීම සඳහා තම දායකත්වය ලබාදෙයි. මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය පිළිබඳ වගකීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතුවේ.

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනය : *24/2, 28 වැනි පටුමග, මල් පාර, කොළඹ 07.*
දුරකථන : *+94 (11) 2565304/5/6*
ෆැක්ස් : *+94 (11) 4714460*
වෙබ් අඩවිය : *www.cpalanka.org*
ඊමේල් : *info@cpalanka.org*

# පටුන

**පෙරවදන** ; එල්.එල්.ආර්.සී වාර්තාව පිළිබඳ මත විමසුම ----------- 5

I එල්.එල්.ආර්.සී පිළිබඳ මහජන මත විමසුම ; ක්‍රමවේදය ------------ 7

II උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සාක්ෂි සමීක්ෂණය ; ක්ෂේත්‍ර කටයුතු ---------------------------------------------------- 9

III කොළඹ දී සාක්ෂි විමසීම ------------------------------------------ 19

IV උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ වැඩමුළු සහභාගිත්ව සමීක්ෂණය---------------------------------------------- 36

V ඇමුණුම් ------------------------------------------------------------ 41

# එල්.එල්.ආර්.සී. වාර්තාව පිළිබඳ මත විමසුම

එල්.එල්.ටී.ඊ සංවිධානය යුදමය වශයෙන් පරාජය කිරීමෙන් පසුව ජනවාර්ගික ගැටලුවට කල් පවත්නා විසඳුමක් සෙවීමේ අරමුණ ඇතිව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පත්කරනු ලැබිණ. මෙම කොමිසම් වාර්තාවේ ඇතුළත් කරුණු පිළිබඳව මහජන කතිකාවතක් ඇතිකිරීමට අවශ්‍ය පියවර ගැනීමක් සිදුනොවූ හෙයින් ඒ පිළිබඳ වැරදි අදහසක් සමාජගතවීමේ අනතුරක් ඇතිවිය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එහිදී මැදිහත් වූයේ අත් හැරී ගිය මහජන කතිකාවත ගොඩනගමින් එහි ඇතුළත් වැදගත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පසුබිමක් නිර්මාණය කිරීම සඳහා ය.

ඒ අනුව එතෙක් සිංහලෙන් හා දෙමළෙන් පළවී නොතිබුණු එල්.එල්.ආර්.සී වාර්තාවේ නිර්දේශ ඇතුළත් නවවැනි පරිච්ඡේදය සරල සිංහලෙන් හා දෙමළෙන් පළ කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පියවර ගන්නා ලදි.

එමෙන්ම දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි සිවිල් සංවිධාන හතළිස් අටකින් තෝරාගත් පුහුණුකරුවන් හතළිස් අටදෙනෙකු දින පහක පුහුණුවකින් පසු වැඩමුළු පැවැත්වීම සඳහා යොමුකරන ලදි. අවම වශයෙන් එක් පුහුණුකරුවකු විසින් වැඩමුළු විස්සත් තිහත් අතර සංඛ්‍යාවක් පවත්වන ලදි. මේ අනුව අඩුම තරමින් මුළු දිවයිනෙන්ම තිස් දහසකට වැඩි පිරිසක් එල්.එල්.ආර්.සී යෝජනා පිළිබඳ දැනුවත් කිරීමට කටයුතු කෙරිණ. දිස්ත්‍රික් මට්ටමේ සම්මන්ත්‍රණ 2215ක්, එමෙන්ම එස්.ජී. පුංචිහේවා මහතා සංස්කරණය කළ එල්.එල්.ආර්.සී යෝජනා පිළිබඳ ප්‍රකාශනය සහ එල්.එල්.ආර්.සී. වාර්තාව පිළිබඳව වූ සාම විමර්ශී සඟරාවේ පිටපත් එක් ලක්ෂ තිස් දහසක ප්‍රමාණයක් දිවයින පුරා බෙදාහැර ඇත.

එල්.එල්.ආර්.සී කොමිසම ඉදිරියේ සාක්ෂි ලබාදුන් පිරිසගෙන් තෝරාගත් අයගේ වත්මන් අදහස් විමසා බැලීම අරමුණු කරගත් සමීක්ෂණයක් පවත්වන ලදි. මේ සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සෝෂල් ඉන්ඩිකේටර් ආයතනය මගින් සකසන ලද ප්‍රශ්නාවලියක් භාවිතා කෙරිණ. උතුරු පළාතේ සාක්ෂි ලබාදුන් විසි දෙනෙකු ද කොළඹින් විසි පස් දෙනෙකු ද මේ සමීක්ෂණය සඳහා සහභාගිකරවා ගන්නා ලදි . එමෙන්ම වැඩමුළුවලට සහභාගි වූ පිරිස අතුරින් අහඹු ලෙස තෝරාගත් එක්දහස් පන්සීයක් ද මේ සමීක්ෂණයට හවුල්කර ගැනිණ. ප්‍රශ්නාවලිය හරහා ලබාගත් දත්තයන් සෝෂල් ඉන්ඩිකේටර් ආයතනය මගින් විශ්ලේෂණය කොට සකස්කරනු ලැබූ මෙය එල්.එල්.ආර්.සී වාර්තාව පිළිබඳ මත විමසුමක් වශයෙන් ඉදිරිපත් කරමු.

මේ පිළිබඳ සමාජ මතය, වාර්ගික ගැටුම්වලින් තොරව සහජීවනය අගයන රටක් නිර්මාණය කිරීමේ වැදගත්කම හා ඊට ඇති බාධා පිළිබඳව වූ මතයන් මේ වාර්තාවේ පිළිබිඹු වේ.

මෙම කර්තව්‍යය සඳහා අපට සහයවූ ෆෙඩ්රිච් නියුමාන් ස්ටිෆ්ටුංග් (FNST) ආයතනයේ සාගරිකා දෙල්ගොඩ මහත්මිය ඇතුළු කණ්ඩායමටත් මේ කාර්යය සාක්ෂාත් කර ගැනීමෙහිලා අපට මග පෙන්වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ අචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතාටත් අප ලබාදුන් තොරතුරු ඇසුරෙන් මත විමසුම සම්පාදනය කළ සෝෂල් ඉන්ඩිකේටර් ආයතනයේ සියලු දෙනාටත් තොරතුරු සමීක්ෂණයේ දී දායකවූ සියලු පුහුණුකරුවන්ටත් විවිධ අයුරින් මීට උපකාර කළ අනෙකුත් සියලු දෙනාටත් බෙහෙවින් කෘතඥ වෙමු.

**ලයනල් ගුරුගේ**
සම්බන්ධීකාරක, ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# I

# එල්.එල්.ආර්.සී පිළිබඳ මහජන මත විමසුම ක්‍රමවේදය

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාව පිළිබඳ මතයන් ලබා ගනු පිණිස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන සෝෂල් ඉන්ඩිකේටර් (Social Indicator) විසින් අඩ වශයෙන් ව්‍යුහගත කළ ප්‍රශ්නාවලීන් දෙකක් සැලසුම් කරනු ලැබ තිබේ. ප්‍රශ්නාවලීන් දෙක සැලසුම් කරනු ලැබ ඇත්තේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හමුවේ සාක්ෂි දෙනු ලැබූවන් (උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සාක්ෂි සමීක්ෂණය) හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගිත්ව වැඩ සටහන් ඒකකය විසින් පවත්වන ලද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළුවලට සහභාගි වූවන් (උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් කොමිෂන් වාර්තාව පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළු සහභාගිත්ව සමීක්ෂණය) සඳහා ය.

සාක්ෂි දෙනු ලැබූවන් සඳහා වන ප්‍රශ්නාවලිය වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ දැනුම්වත්භාවය හා ඒ කොපමණ දුරකට ද,, උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ ඔවුන්ගේ බලාපොරොත්තු, වාර්තාව හා නිර්දේශ ද ක්‍රියාකාරී සැලස්ම ක්‍රියාවට නැගීම ද පිළිබඳ ඔවුන්ගේ අදහස මැන බැලීමට උත්සාහ දැරී ය. වැඩමුළු සහභාගිකයන් සඳහා වූ ප්‍රශ්නාවලීන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ හා ආණ්ඩුවේ ක්‍රියා සැලස්ම පිළිබඳ ප්‍රතිචාර දක්වන්නාගේ අදහස මෙන්ම

ඒවා ක්‍රියාවට නැගීම හා එම ක්‍රියාවලියේ ප්‍රධාන ක්‍රියාකාරීන් පිළිබඳ ඔවුන්ගේ සිතිවිලි ද පිරික්සා බලනු ලැබිණ.

තමන්ම කළමනාකරණය කර ගත යුතුව තිබූ ප්‍රශ්නාවලීන් සිංහලට හා දෙමළට පරිවර්තනය කරනු ලැබිණ. කොමිසම හමුවට පැමිණ සාක්ෂි දුන් සංවිධාන හා පුද්ගලයන් තනි තනිව මුණ ගැසී ප්‍රශ්නාවලීන් ලබා දෙන ලද අතර ඒවා සම්පූර්ණ කිරීමෙන් පසු ප්‍රජා සහභාගිත්ව වැඩ සටහන් ඒකකය වෙත ආපසු එවනු ලැබිණ. වැඩමුළු සහභාගිකයන් සඳහා වූ ඒවා පිරවීම පිණිස වැඩමුළුව අවසානයේ දී සියලු සහභාගිකයන් වෙත බෙදා හැරිණ.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හමුවේ සාක්ෂි දෙන ලද්දන් සඳහා වූ ප්‍රශ්නාවලිය ප්‍රතිචාර දැක්වූවන් 47 දෙනෙකු විසින් සම්පූර්ණ කරනු ලැබ තිබිණ. රටේ සෑම දිස්ත්‍රික්කයකම වැඩමුළු පවත්වන ලද හෙයින් වැඩමුළු සහභාගික සමීක්ෂණය 1440 සඳහා නියැදියක් සකස් කරමින් වැඩමුළු සහභාගිකයන් විසින් සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලීන් 60 සෑම දිස්ත්‍රික්කයකින්ම අහඹු ලෙස තෝරා ගනු ලැබිණ. සමීක්ෂණ දෙකෙහිම දත්ත දත්ත මූලකයකට ඇතුළත් කරනු ලැබූ විට සමාජ විද්‍යාවන් සඳහා වන සංඛ්‍යාන පැකේජය (Statistical Package for Social Sciences –SPSS) යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය කරනු ලැබිණ.

# II

# උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සාක්ෂි සමීක්ෂණය

## <u>ක්ෂේත්‍ර කටයුතු</u>

පහතින් එන අදහස් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ ක්ෂේත්‍ර සංචාර විභාගයන්හි දී සාක්ෂි දෙන ලද පුද්ගලයන් 22 ගේ අදහස් ය. ඔවුන්ගේ වත්මන් නේවාසික දිස්ත්‍රික්ක වනුයේ මඩකලපුව, මන්නාරම, මුලතිව් හා කිලිනොච්චිය ය. සාක්ෂි දෙන ලද 22 නා ම වයස 30 ට වැඩි වූවන් ය.

### *උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ දැනුවත්බව හා අපේක්ෂා*

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හා එහි කටයුතු පිළිබඳ ප්‍රතිචාරක දැනුම ඉතා අඩු ය. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ජීවත්වන ප්‍රතිචාරකයෙකු විශේෂ වශයෙන් සඳහන් කර තිබුණේ කිලිනොච්චි හා මන්නාරම යන දිස්ත්‍රික්කවල උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ දැනුවත්බව ප්‍රමාණවත්ව නොතිබුණ බව හා ජනතාවගේ බහුතරය උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම තේරුම් ගෙන නොතුබූ බව ය.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම කෙරෙහි ඔවුන්ගේ උනන්දුවෙන් වැඩිම හරියකට හේතු වූයේ කොමිසම යුද්ධය සමයේ අතුරුදහන් වූ හෝ අත් අඩංගුවට ගනු ලැබූවන් සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙනු ඇතැයි ඔවුන් විශ්වාස කළ නිසාය යන්න පැහැදිලි ය.

ඔවුන්ට පළමුවෙන්ම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳව අසන්නට ලැබුණේ කෙසේදැයි විමසූ විට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 20 දෙනෙකු කියා සිටියේ ඔවුන් එය මාධ්‍ය මගින් දැන ගත් බව ය. තිදෙනෙකු උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ කාර්යය වූයේ යුද්ධයෙන් හානියට පත් වූවන් සඳහා විසඳුමක් සොයා ගැනීම බව පැවසූ අතර තවත් තිදෙනෙකු කියා සිටියේ එය විසඳුමක් සොයන බව බොරුවට පෙන්වීමට පිහිටුවන ලද කමිටුවක් වූ බව ය. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 6 දෙනෙකු විසින් මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙනු නොලැබිණ. පිළිතුරු සපයන ලද අනෙකුත් අය පහත සඳහන් ප්‍රතිචාර දැක් වූහ -

- *30 වසරක ජනවාර්ගික ගැටුමේ මූල හේතු සොයා ගැනීම පිණිස පිහිටුවන ලද කොමිසමකි. (2)*
- *අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගනු ලැබ තිබෙන අය මුදා හැරීම සඳහා පිහිටුවන ලද්දකි.*
- *ජනවාර්ගික ගැටුමට විසඳුමක් සොයා ගැනීම පිණිස පිහිටුවන ලද කොමිසමකි. (2)*
- *යුද්ධය හේතු කොට ගෙන අතුරුදහන් වූ බවට වාර්තාවී තිබෙන අයවලුන් සොයා ගැනීම පිණිස පත් කරන ලද කොමිසමකි.*
- *රටේ ආසන්නතම භාෂා ගැටලුව විසඳීමට හා එමගින් ජනවාර්ගික ගැටුම විසඳීම පිණිස පත් කරන ලද කොමිසමකි.*

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ පුවත් හා යාවත් කාලීන කිරීම් සඳහා වන තොරතුරු පිළිබඳ මූලික මූලාශ්‍රව පැවතුණේ පුවත්පත් හා ගුවන් විදුලිය ය. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 10 දෙනෙකු තිනකුරල්, වීරකේසරී හා උදයන් යන පුවත්පත්වල සඳහන් ව තිබූ බව පැවසූ අතර 11 දෙනෙකු පැවසුවේ ඔවුන්ගේ මූලික මූලාශ්‍රය රේඩියෝව නිදසුන් ලෙස ශක්ති FM, සූරියන් FM, වසන්තන් FM හා BBC බව ය.

සිය සාක්ෂි ඉදිරිපත් කිරීමේ දී ප්‍රතිචාර දැක්වූවන්ගේ අපේක්ෂාවන් වූයේ මොනවා ද? ප්‍රතිචාර දැක්වූවන් 22 දෙදෙනාගෙන් 12 දෙනෙකු සඳහන් කළේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හමුවේ සාක්ෂියක් දීම මගින් ඔවුන් යුද්ධයේ කාලය තුළ අතුරුදහන් වූවන් ලෙස වාර්තාගතව තිබෙන අය පිළිබඳව පිළිතුරු අපේක්ෂා කළ බව ය. තිදෙනෙකු ඔවුන්ට යුක්තිය දකින්නට උවමනා වූ නිසා සාක්ෂි දුන් බව පැවසූ අතර දෙදෙනෙකු පැවසුවේ අත් අඩංගුවට ගෙන තිබෙන අය නිදහස් කරනු දැකීමේ අපේක්ෂාවෙන් සාක්ෂි දුන් බව ය. මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයූ තවත් දෙදෙනෙක් මෙම ප්‍රශ්නයට පහත සඳහන් පිළිතුරු සැපයූහ.

- යුද්ධයේ අවසන් අදියරයන්ට අදාළව සපයන ලද තොරතුරුවලට කොමිසම සාවධාන වනු ඇත.
- මානව හිමිකම් උල්ලංඝනයන් අවසානයකට ගෙන එනු ඇත.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ අවසාන වාර්තාව ඔවුන්ගේ බලාපොරොත්තු සපුරාලනු ඇත්දැයි විමසූ විට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 20 දෙනෙකු නැතැයි පැවසූ අතර දෙදෙනෙකු ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ නැත.


## 1. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව හා නිර්දේශ

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ අවසන් වාර්තාව ප්‍රසිද්ධියට පත් කර තිබේය යන්න දැන සිටියේ ප්‍රතිචාර දැක්වූවන් 22 දෙදෙනාගෙන් දෙදෙනෙකු පමණි. ආණ්ඩුව විසින් වාර්තාවේ සිංහල හා දමිළ පරිවර්තන ලැබෙන්නට සලස්වා නොමැති සහ වාර්තාවේ ආණ්ඩුවේ නිල පිටපත් තිබෙන්නේ ඉංග්‍රීසියෙන් පමණක් වන තත්ත්වයක් තුළ මෙය බලාපොරොත්තු විය යුත්තකි.


ඔවුන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවේ හෝ කොමිසම පිළිබඳ ලේඛනයක/පොත්පිංචක හෝ පිටපත් ලබා ගත්තේ කෙසේදැයි විමසූ විට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 7 දෙනෙකු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් ද දෙදෙනෙකු ජාතික සාම මණ්ඩලයෙන් ද ලබා ගත් බව පැවසූ අතර තවත් 4 දෙනෙකු පහත සඳහන් ප්‍රතිචාර ලබා දුනි. මිතුරකුගෙන්, පත්තරයෙන් හා කොමිසමේ නිලධාරියෙකුගෙන්.

ප්‍රතිචාර දැක්වූවන්ට පහත සඳහන් ප්‍රකාශන ලබා දෙන ලද අතර ඔවුන්ට ඔවුන් බෙහෙවින්ම එකඟවන ප්‍රකාශනය තෝරන ලෙස කියනු ලැබිණ.

## ප්‍රස්තාර 1 - පහතින් එන ප්‍රකාශවලින් ඔබ එකඟ වන්නේ කුමක් සමග ද?



*ප්‍රස්තාර 2 - උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ පිළිබඳ ඔබේ අදහස කුමක් ද? (එක පිළිතුරකට වඩා තෝරාගත හැකි ය.)*




නිර්දේශ ප්‍රායෝගික යයි පැවසූ ප්‍රතිචාර දැක්වූවන් ද ඒවා තීරණාත්මක ප්‍රශ්න ගණනාවකට ආමන්ත්‍රණය කර නැතැයි ද එසේම ඒවා අපේක්ෂාවන්ගේ මට්ටමට ළඟා වී නැතැයි ද යන පිළිතුර තෝරා ගෙන ඇත. නිර්දේශ ප්‍රායෝගික යයි පැවසූ එක් ප්‍රතිචාර දැක්වූවෙක් පහත සඳහන් හේතූන් නිසා එසේ විශ්වාස කරන බව පැවසීය.

- *පුනරුත්ථාපනය, හමුදාව විසින් රඳවා ගෙන සිටින අයවලුන් නිදහස් කිරීම, ජීවිකාවෘත්ති ප්‍රශ්න වැනි ඇතැම් ප්‍රශ්නවලට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.*

එසේම නිර්දේශ ප්‍රායෝගික යයි විශ්වාස කළ ප්‍රතිචාර දැක්වූවන් 4 දෙනෙකු පැවසූවේ නිර්දේශ ක්‍රියාත්මක කළ හැක්කේ වුව ද ආණ්ඩුව

කාලය කා දමමින් හා ක්‍රියාත්මක කිරීමෙහිලා කැප වෙමින් නොසිටින බව ය.

නිර්දේශ ඔවුන්ගේ අපේක්ෂාවන්ගේ මට්ටමට ළඟා වී නැතැයි ද ප්‍රශ්න ගණනාවකට ආමන්ත්‍රණය කර හෝ ඒවාට ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර හෝ නැතැයි ද සඳහන් කළවුන් ඒ සම්බන්ධයෙන් පහතින් එන හේතු දක්වා ඇත.

- *යුද්ධය මගින් විපතට පත් වූවන්ට ප්‍රමාණවත් නොවන විසඳුමක් දෙනු ලැබීම*
- *යුද්ධයේ අවසන් අදියරයන්ගේ කාලය තුළ සිවිල් වැසියන්ගේ මරණ පිළිබඳ තොරතුරුවලට ප්‍රමාණවත් නොවන අවධානයක් දෙනු ලැබීම*
- *සුදු කොඩි ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රමාණවත් නොවන සේ ආමන්ත්‍රණය කිරීම*
- *දෙන ලද සාක්ෂිය ප්‍රමාණවත් ලෙස විමසා නොබැලීම හෝ ප්‍රසිද්ධියට පත් නොකිරීම*
- *යුද්ධයෙන් විපතට පත් වූවන්ගෙන් බහුතරය බිය හේතු කොට ගෙන ඔවුන්ගේ සාක්ෂි ලබා දීමට නොපැමිණීම; එනයින් ඔවුන්ගේ සැබෑ ප්‍රශ්න හා අවශ්‍යතා වාර්තාවෙහි පිළිබිඹු නොවීම*
- *වාර්තාව යුද්ධයේ මූල හේතූන්ට ආමන්ත්‍රණය කිරීමවත් මානව හිමිකම් උල්ලංඝන ප්‍රශ්න සම්බන්ධයෙන් ක්‍රියා කිරීමවත් නොකිරීම*

සමහර නිර්දේශ පමණක් ක්‍රියාවට නැගිය හැකි යයි පැවසූ එක් ප්‍රතිචාර දැක්වූවෙක් කියා සිටියේ පරිපාලන නිර්දේශ පමණක් ක්‍රියාත්මක කළ හැකි බව ය.

## *2. ආණ්ඩුවේ කැපවීම*

ශ්‍රී ලංකා ආණ්ඩුව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහිලා සම්පූර්ණයෙන් කැප වූයේ යයි කියා ඔවුන් සිතුවේ දැ යි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අසනු ලැබිණ. 15 දෙනෙකු නැතැයි ද 5 දෙනෙකු ඔවුන්ට ස්ථිර ලෙස කිව නොහැකි හෝ දන්නේ නැතැයි ද පැවසීමෙන් හා දෙදෙනෙකු පිළිතුරු නොදීම තෝරා ගැනීමෙන් යනාදී ලෙස ප්‍රතිචාර දැක්වූවන් කිසිවෙකු ඔව් ය යන පිළිතුර දුන්නේ නැත.

ආණ්ඩුව සම්පූර්ණයෙන් කැප වන්නේ යයි ඔවුන් නොසිතන්නේ මන්දැ යි පැහැදිලි කරන්නට ඔවුන්ට කී විට ඉහත සඳහන් ප්‍රශ්නයට 'නැත'යි පිළිතුරු දුන් ප්‍රතිචාර දැක්වූවන් ලබා දුන්නේ පහතින් එන පිළිතුරු ය.

- නිර්දේශ තවමත් ක්‍රියාත්මක කර නැත (5)
- යුද්ධය සමයේ අත් අඩංගුවට ගත් පුද්ගලයන් තවමත් නිදහස් කර නැත (2)
- සිවිල් යුද්ධය අවසානයකට පත් වූ තැන් පටන් වසර තුනක්ව තිබියදීත් යුද්ධය හේතු කොට ගෙන අතුරුදහන්ව ඇති බවට වාර්තා වී ඇති අයවලුන් සම්බන්ධ තොරතුරු තවමත් අදාළ අය වෙත හෙළි කරනු ලැබ නැත (2)

- අවසාන වාර්තාව ප්‍රකාශයට පත් කරනු ලැබ තිබෙන්නේ වුව ද උතුරෙහි අගති සහගත ඉඩම් අත්පත් කර ගැනීම, අත් අඩංගුවට ගනු ලැබුවන් කරන හිංසනය හා වාර්ගික ගැටුම් තවමත් අඛණ්ඩව කෙරී ගෙන යාම

- දෙන ලද සාක්ෂි ජනතාවට ප්‍රචාරණය කරනු නොලැබීම හා ක්‍රියාවට නොනැගීම

- යුද්ධයේ අවසානයකට පත් වූ තැන් පටන් වසර තුනක් ඉකුත්ව ගොස් තිබෙන්නේ වුව ද පැවතිය හැකි විසඳුමක් සොයා ගෙන නොමැතිවීම

- ආණ්ඩුවෙන් එල්ලවන තර්ජන අඛණ්ඩව සිදු වීම

### *3. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ සිතිවිලි*

ප්‍රතිචාර දැක්වූවන් 22 දෙනා සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවන් ගෙන් ලද පොදු හැඟීම වන්නේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ එතරම් විශ්වාසයක් නොමැත්තේය යන්න ය. එක් ප්‍රතිචාර දැක්වූවෙකු විසින් පැහැදිලි කරන ලද පරිදි *"සාක්ෂි ලබා ගන්නා ලද ප්‍රදේශවල හමුදාව මුර සංචාරයේ යෙදී සිටි හෙයින් බිය හේතු කොට ගෙන ඔවුන්ගේ සාක්ෂි ලබා දීමට යුද්ධයෙන් විපතට පත් බහුතරයක් දෙනා ඉදිරිපත් නොවීම නිසා වාර්තාව යුද්ධයෙන් විපතට පත්වූන්ගේ අවශ්‍යතා නියෝජනය කරන්නේ නැත. තව ද ඔවුන්ගේ සාක්ෂි දීමට ඉදිරිපත් වූවන්ට පවා ලබා දුන් සීමාසහිත කාල ප්‍රමාණය වැනි හේතු නිසා සාක්ෂි දීමට නොහැකි වූ අතර ඔවුන්ගේ සාක්ෂි ලිඛිතව ලබා දෙන්නැයි කියා සිටීමේ හේතුව නිසා ඇතැම් පුද්ගලයන්ට සාක්ෂි දීමට නොහැකිව තිබුණි."*

ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කළ පරිදි නාගරික ප්‍රදේශ ඇතුළත විමර්ශනයේ විෂය පථය ඉතා පටු වීම හා එයටම සීමා වීම, ඈත එපිට ප්‍රදේශවල ජනයා වාර්තාව පිළිබඳ ප්‍රමාණවත්ව දැනුවත් කර නොතිබීම, කොමිසම ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබ තිබීම යන කාරණය හේතුවෙන් කොමිසමේ ස්වාධීනත්වය ගැන සැක සහිත වීම නිසා යාන්ත්‍රණයේ කාර්ය සාධනීයත්වය එය විසින්ම ප්‍රශ්න කරනු ලබන්නක්ව පැවතිණ.

වාර්තාවෙහිම අන්තර්ගතය සම්බන්ධයෙන් ගත් කල යුද්ධය කාලයේ සිදු වූ සිවිල් වැසියන්ගේ මරණ (ආරක්ෂිත කලාපයෙහි කොටුවී මිය ගිය සිවිල් වැසියන් ද ඇතුළුව) සම්බන්ධ තොරතුරු හා යුද්ධයෙන් හානියට පත් ප්‍රදේශවල ජනයා විසින් මුහුණ දෙනු ලබන ප්‍රශ්න පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැතියැයි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් ඇතැම්හු විශ්වාස කරති.

# III

## කොළඹ දී සාක්ෂි විමසීම

කොළඹ දී පවත්වන ලද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හමුවේ සාක්ෂි දුන් පුද්ගලයන් 25 දෙනා මෙම සමීක්ෂණයෙහි ප්‍රතිචාර දැක්වූවෝ වූහ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පූජ්‍ය පක්ෂය, මාධ්‍යවේදීන්, සිවිල් සමාජ ක්‍රියාකාරිකයන් හා දේශපාලඥයන් ඔවුන් අතර විය.

*ප්‍රතිචාර දැක්වූවන්ගේ අපේක්ෂා*

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 12 සම්බන්ධයෙන් ගත් කල ඔවුන් සාක්ෂියක් දීමට ප්‍රධාන හේතුවක් වූයේ සමගිසන්ධානය හා සංවර්ධනය කරා වන ඔවුන්ගේ කාර්ය කොටස ඉටු කිරීම - විශේෂයෙන්ම සමගිසන්ධාන ක්‍රියාවලියට ගරුත්වය දැක්වීම, ජාතික සාම අභිප්‍රාය සඳහා ආණ්ඩුව සමග අත්වැල් බැඳ ගැනීමේ සමාජයේ කැමැත්ත විදහා දැක්වීම, රටේ අනාගත සංවර්ධනයට දායක වීම, රටේ සාමයට හා එක්සත්භාවයට බාධාවක් වන කරුණු ඉදිරිපත් කිරීම හා පෙන්වා දීම ය.

ප්‍රතිචාර දැක්වූවන්ගේ අනෙකුත් අපේක්ෂාවන්ට පහතින් එන ඒවා ඇතුළත් වේ.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම  පිළිබඳව සාක්ෂි ප්‍රකාශයක් සැපයීමෙහි පෞද්ගලික අරමුණ වූයේ යම් දවසක නිර්දේශ සම්බන්ධ පුද්ගලයන්ගේ අදහස් ප්‍රකාශයට පත් කරනු හා ක්‍රියාවට නගනු ඇත යන්න ය.

- ත්‍රස්තවාදීන් විසින් ඇති කරන ලද විනාශය සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක සාක්ෂි ඉදිරිපත් කිරීම. කෙසේ වුව ද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව සිංහල ජනතාව පිළිබඳව කතා කර නැත.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ සභාපති ශ්‍රී ලංකාවෙහි සාමය හා සමගිසන්ධානය ඇති කිරීම පිණිස හා වඩා හොඳ සමාජයක් නිර්මානය කිරීම පිණිස ජනාධිපතිවරයාට බලපෑමක් කරනු ඇතැයි අපේක්ෂා කෙරිණ.

- සිවිල් යුද්ධය සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් බෙදාහදා ගැනීම

- දමිළ ප්‍රජාව  කරන විවිධ චෝදනා වැරදි වූ බව ඔප්පු කිරීම. නිදසුන් ලෙස උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම දමිළ ප්‍රජාවට විරුද්ධ වීය යන චෝදනාවක් විය. මෙය වැරදි බව ඔප්පු කිරීමට ය.

- පසු ගිය වසර ගණනාවක කාලය තුළ බොහෝ ආණ්ඩු විසින් දමිල ප්‍රජාව හට කරන ලද අසාධාරණයන් විශාල ප්‍රමාණයක් වීය. මෙම සාක්ෂි ප්‍රකාශය සැපයීමෙහි ප්‍රධාන අරමුණ වූයේ සුළුතර ප්‍රජාව සමග සැබෑ බැඳීම් වැඩි දියුණු කිරීම පිණිස අධාර වනු ඇති කරුණු පෙන්වා දීම ය. සුළුතර ප්‍රජාවන්ට අදාළව ආමන්ත්‍රණය කර තිබෙන නිර්දේශ යහපත් වන අතර තව දුරටත් ප්‍රමාද නොවී ක්‍රියාවට නැංවිය යුතු ය.

- ජාතික අර්බුදයට විසඳුමක් සොයා ගැනීමට ය.

- වසර ගණනාවක් පුරා බලාපොරොත්තු කඩ කරන ලද හා සිත් පාරවන ලද දමිල ජනතාව විශේෂයෙන් තරුණ ජනයා වෙත සිංහල ප්‍රජාව විසින් ඒක පාර්ශවීය වශයෙන් විදහා දක්වන ලද නිර්හීත හැඟුම් සමුදාය ය.


- ජාත්‍යන්තර ප්‍රජාවට කළ හැක්කේ ආධාර කිරීම පමණකි. සාමය හා සමගිසන්ධානය ඇති කරන්නට බැරි ය. සාමය හා සමගිසන්ධානය ඇති කරනු ලැබිය හැක්කේ ශ්‍රී ලාංකිකයන්ට, ඔවුන්ටම පමණි. මාර්ග සිතියමක් සැපයීම මගින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමට භාර වූයේ නිවැරදි ලෙසම එයයි. විශේෂයෙන්ම සභාපතිවරයාට ජනාධිපතිවරයා වෙත බලපෑමක් කළ හැකිවනු ඇතැයි මම අපේක්ෂා කරමි.

ප්‍රතිචාර දැක්වූවන් 9 දෙනෙකු උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම ඔවුන්ගේ අපේක්ෂා සපුරා ලූ බව ද 10 දෙනෙකු එසේ නොවූ බව ද පැවසූ අතර තිදෙනෙකු පැවසුවේ ඒවා තරමක් දුරකට සපුරා ලූ බව ය.

### *උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව හා නිර්දේශ*


ප්‍රතිචාර දැක්වූවන් 25න් 21 දෙනෙකු උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව ප්‍රකාශයට පත් කර තිබූ බව දැන සිට තිබුණි. ඔවුන්ට පහතින් එන ප්‍රකාශ දෙනු ලැබ වාර්තාව සම්බන්ධ ඔවුන් වඩාත්ම එකඟ වන්නේ කුමන ප්‍රකාශය ද යන්න තෝරන්නට උපදෙස් දෙනු ලැබිණ.

*ප්‍රස්තාරය 4 පහත ප්‍රකාශවලින් ඔබ එකඟ වන ප්‍රකාශය කුමක් ද?*




ප්‍රතිචාර දැක්වූවන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාවේ පිටපත් රාජ්‍ය නොවන සංවිධානවලින්, අන්තර් ජාලයෙන්, කෙළින්ම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ කාර්ය මණ්ඩලයෙන්, මිතුරන්ගෙන් හෝ සේවයෙහි නියුතු ස්ථානයෙන් ලබා ගෙන තිබේ.

*ප්‍රස්තාරය 5-* උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ පිළිබඳ ඔබේ අදහස කුමක් ද? (එක පිළිතුරකට වඩා තේරිය හැකි ය)



ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩිම දෙනෙක් නිර්දේශ ප්‍රායෝගික යයි විශ්වාස කරති. ඇතැමෙකු නිර්දේශ ඔවුන්ගේ අපේක්ෂාවන් ඉක්මවා ඇතැයි ප්‍රකාශ කරන අතර ඇතැමෙකු පැවසුවේ නිර්දේශ තීරණාත්මක ප්‍රශ්නවලට ආමන්ත්‍රණය නොකරන බව ය. නැතහොත් ඇතැම් ඒවා බෙහෙවින්ම යථාර්ථවාදී නොවන බව ය.

නිර්දේශ පිළිබඳ ඔවුන්ගේ අදහසට හේතු පැහැදිලි කරන්නැයි පැවසූ වට ප්‍රතිචාර දැක්වූවන් විසින් පහත සඳහන් ඒවා ප්‍රකාශ කෙරිණ.

- හේතුව වන්නේ සරණාගතයන් නැවත පදිංචි කිරීම, මැතිවරණ, ව්‍යුහාත්මක සංවර්ධනයට ගනු ලැබූ පියවර හා බිම් බෝම්බ ඉවත් කිරීම සම්බන්ධව ගනු ලැබූ පියවර ද සාර්ථකත්වයක් අත්කර ගැනීම ය. මෙය ආණ්ඩුව විසින් පත් කරනු ලැබ තිබෙන කොමිසමකි. එහෙයින් ආණ්ඩුව එහි සඳහන් කර ඇති නිර්දේශ මගින් බැඳී සිටීමේ වගකීමට බැඳේ.. කෙසේ වුව ද රටේ දේශපාලන විසඳුම සම්බන්ධ විසඳුම්වලට සම්පූර්ණයෙන් ආමන්ත්‍රණය කර නැත.

- පොදු මහ ජනතාව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම කුමක් සඳහා ද යන්න පිළිබඳව දැනුවත් නැත. විස්තර බෙහෙවින් ගැඹුරු හෙයින් ජනතාවට නිර්දේශ වටහා ගැනීමට නොහැකි ය. එය වඩාත් සරල ආකාරයකට ඉදිරිපත් කළ යුතු ය.

- අප බලාපොරොත්තු වූයේ වාර්තාවකි. ජනතාවගේ දෘෂ්ටිමය ආකල්ප නොවේ. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම

සම්බන්ධ ප්‍රධාන ප්‍රශ්නය වනුයේ එය නිශ්චිත දෘෂ්ටිවාදයක් යටතේ වැඩ කරමින් සිටින බව ය.

- *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා ජාතික සාම මණ්ඩලය වැනි ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන ඔවුන්ගේම අදහස්වලට අනුව බලය බෙදීම පිළිබඳ නිර්දේශ අර්ථ නිරූපණය කරන අතර එම නිර්දේශවල විස්තර කර දක්වා ඇති තත්ත්වයන් සලකා බලන විට ඒවා ක්‍රියාවට නැගිය හැකි බව අපි දකිමු. එසේම අනෙකුත් සියලු නිර්දේශ ද ක්‍රියාත්මක කරන්නට පුළුවන.*

- *බොහොමයක් ප්‍රායෝගික වන අතර කැපවූ නායකත්වයක් මගින් ක්‍රියාවට නැගිය හැකි ඒවා ය.*

- *මා කිසියම් දුරකට මුළුමහත් ක්‍රියාවලිය පිළිබඳව සර්වදෝෂදර්ශීව සිටි බැවින් යටත් පිරිසෙයින් දමිළ ජනතාවගේ දුක් ගැනවිලිවලට ආමන්ත්‍රණය කරන කිසියම් නිර්දේශ ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබීම සම්බන්ධයෙන් සතුටු වෙමි.*

- *වාර්තාවෙහි සිංහලයාට කර ඇති අසාධාරණයන් සම්බන්ධයෙන් කිසිවක් අඩංගු නොවේ. මෙය බරපතල අපරාධයකි. සිංහල ජනතාවට එය විසින් කර ඇති අසාධාරණ බව හේතු කොට ගෙන මට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව සමග එකඟ වන්නට බැරි ය.*

- *සමගිසන්ධානයට හා යහ පාලනයට අදාළ නිර්දේශ සතුටුදායක ය. එසේ වුව ද සත්‍යයට හා වගවීමට අදාළ කොටස්වල ඇතැම් අඩුපාඩු තිබේ.*

- හේතුව වන්නේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවෙහි සඳහන් කර ඇති ඇතැම් නිර්දේශ (ඇතැම් ඒවා යථාර්ථවාදී නැත) සුළුතර ප්‍රජාවන් ඉලක්ක කර තිබීම හා ජනවාර්ගික ගැටුම් පිළිබඳව අවධාරණය කර තිබීම ය. තව ද බලය බෙදා හදා ගැනීම පිළිබඳ මාතෘකාව අදාළ නොවේ.

- නියම ලෙස ක්‍රියාවට නැගිය හැකි යම් නිර්දේශයක් වේ නම් ඒවැනි නිර්දේශ බලාත්මක කළ යුතුව තිබේ. කෙසේ වුව ද ක්‍රියාවට නැගිය නොහැකි නිර්දේශ තිබේ නම් ඒවිට අප ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැක්කේ මන් ද යන්න සොයා ගැනීම ද ක්‍රමයක් හා එය ක්‍රියාවට නැගීමට මගක් නිර්මාණය කර ගැනීම ද අපේ සොයා ගැනීම් ජාත්‍යන්තර ප්‍රජාව වෙත ඉදිරිපත් කර ඔවුන්ගේ විශ්වාසය දිනා ගැනීම හා ගොඩ නගා ගනීම ද අවශ්‍ය ය.

- රාජ්‍යය විසින් චෝදිත යුද අපරාධ විමර්ශනය කරනු ලැබීමේ අවශ්‍යතාව පිළිබඳ තීරණාත්මක ප්‍රශ්නයට කොමිසම ආමන්ත්‍රණය කර නැත. කෙසේ වුව ද ඔවුන් යොමු කිරීම් අනුදේශවල (TOR) ඇතුළත් කර නොමැති නැතිවූ පුද්ගලයන් හඳුනා ගැනීමේ හා ඉන්නා තැන් සොයා ගැනීමේ හදිසි අවශ්‍යතාව, අධි ආරක්ෂිත කලාප ලෙස රාජ්‍යය විසින් අත්පත් කර ගනු ලැබ තිබෙන දේපළ හා ඉඩම් පුද්ගලයන්ට කඩිනම්ව ආපසු ලබා දීම, යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස දේපළ හා ජීවිත විනාශය සම්බන්ධයෙන් රාජ්‍යය ජනතාවට ප්‍රසිද්ධ ශෝකය ප්‍රකාශ කිරීමක් කිරීමේ අවශ්‍යතාව වැනි වැදගත් ක්ෂේත්‍ර ඇතුළත් කර ඇත.

- එසේ කිරීමට අධිෂ්ඨානය තිබේ නම් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශවලින් බොහොමයක් පහසුවෙන් ක්‍රියාවට නැංවිය හැකි ය.

- සාක්ෂි විමසීම්වලට පෙර කොමසාරිස්වරුන් කිහිප දෙනෙකුගේ වාර්තාගත වූ ප්‍රකාශන මත පදනම් වූ සැක සාංකාවන් සැබෑ තත්ත්වය තක්සේරු කිරීමට දරන ලදැයි පෙනෙන අවංක ප්‍රයත්නයන් මගින් විශාල වශයෙන් පහව ගොස් ඇත. අර්ථදායී යයි පෙනෙන නිශ්චිතතාවෙන් ඌන නිර්දේශ නිසා අතපසු කිරීම, ප්‍රමාද කිරීම හා සම්පූර්ණ නොසලකා හැරීම සඳහා අවකාශ විවර කරයි. ජෙනරල් සරත් ෆොන්සේකා නීතිවිරෝධී ලෙස බන්ධනාගාරගත කිරීම හා කිසිලෙසකින් ආරක්ෂා කළ නොහැකි 18 වන සංශෝධනය සම්බන්ධව පැහැදිලි ලෙසම ආමන්ත්‍රණය කර නොමැත.

### *ආණ්ඩුවේ කැපවීම*

ආණ්ඩුව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහිලා සම්පූර්ණයෙන් කැප වූයේ යයි කියා ඔවුන් සිතුවේ දැ යි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අසනු ලැබිණ. 4 දෙනෙකු පමණක් ඔව් යයි පිළිතුරු දුන් අතර 15 දෙනෙක් නැතැයි පැවසූහ. 6 දෙනෙකු පැවසුවේ ආණ්ඩුව කිසියම් දුරකට සම්පූර්ණ වශයෙන් කැප වූ බව ඔවුන් විශ්වාස කළ බව ය.

ඔව් යයි පිළිතුරු දුන් එක් ප්‍රතිචාර දැක්වූවෙකු එසේ විශ්වාස කරනුයේ සරණාගතයින් නැවත පදිංචි කිරීම, මැතිවරණ, ව්‍යුහාත්මක

සංවර්ධනය හා බිම් බෝම්බ ඉවත් කිරීම සම්බන්ධයෙන් ගනු ලැබූ පියවරයන්හි සාර්ථකත්වයක් තිබෙන නිසා බව ය.

නැතැයි පිළිතුරු සැපයූ අය පහතින් එන හේතු සඳහන් කළහ.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ කැපවීම හා වගකීම අඩු ය.

- *පහසුවෙන් ක්‍රියාවට නැංවිය හැකි නිර්දේශ ක්‍රියාවට නංවා නොමැත්තේ ය. නිදසුන් ලෙස ජාතික ගීය භාෂා දෙකෙන්ම ගයනු නොලැබේ. ක්‍රියාවට නංවමින් තිබෙනුයේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවේ තිබෙන දෙයට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ දේ ය. ක්‍රියා සැලැස්ම කිසිදු වැදගත් දෙයකින් සමන්විත නොවන අතර උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවෙහි සඳහන් වූ සංයුක්ත කිසිවක් ඇතුළත් කර නැත.*

- *මේ දක්වා ආණ්ඩුව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවේ නිර්දේශ සපුරාලීමෙහිලා ප්‍රමාණවත් ප්‍රගතියක් පෙන්වා නොමැත. මේ දක්වා ගෙන ඇති සෑම පියවරක්ම ඔවුන් අවශ්‍ය කරන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නංවනු ලබන බව ලෝකයට පෙන්වීමේ හුදු මතුපිට ප්‍රයත්නයක් පමණි.*

- *ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අවරෝධකයක් ලෙස තබා ගැනීමට ද ජාත්‍යන්තර චෝදනාවන්ට ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට ද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම යොදා ගැනේ. ඔවුන් කාර්ය සාධක බලකායක් පත් කර අයවැයෙන්*

*මුදල් ද වෙන් කරන ලද නමුදු ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියෙහිලා කොහෙත්ම උනන්දුවක් දක්වා නැත.*

- *අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද කොමිසමක් වශයෙන් වාර්තාවට දැක්වූ මූලික ප්‍රතිචාරය බලාපොරොත්තු වූවක් නොවී ය. මගේ හැඟීම වූයේ අවසාන වාර්තාව නිකුත් වූ වහාම ආණ්ඩුව කඩිනමින්ම කෙටි කාලීන, මැදි කාලීන හා දිගු කාලීන පදනමක් මත නිර්දේශ ක්‍රියාවට නංවනු ඇත කියා යි.*

- *ආණ්ඩුව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිහිටුවූයේ ජාත්‍යන්තර ප්‍රජාව සතුටු කරනු සඳහා පමණක් මිස රට මුහුණ දෙමින් සිටින ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීමේ කිසිදු කැපවීමක් හේතු කොට ගෙන නොවේ. තව ද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ආණ්ඩුව විසින් ඔවුන් උදෙසා නියම කරන ලද අරමුණුවලින් ඔබ්බට ගොස් තිබෙන හෙයින් වත්මන් ආණ්ඩුව ඒවා ක්‍රියාත්මක කරනු ඇත්දැයි මම සැක කරමි.*

ආණ්ඩුව කිසියම් දුරකට සම්පූර්ණ වශයෙන් කැප වූයේ ය යනුවෙන් පමණක් තමන් විශ්වාස කළ බව පැවසූවෝ ඊට පහතින් එන හේතු දැක් වූහ. *රටේ සමාජ ආර්ථික තත්වයට එල්.ටී.ටී.ය විසින් සිදුකළ විනාශය උගත් පාඩම් කොමිසමේ වාර්තාවෙන් නොදැක්වේ. එමෙන්ම ජාතිය වෙත එල්ලවන දෙමළ බලපෑම ද එහි නොදැක්වේ. එබැවින් ශ්‍රී ලංකාවේ රජය එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කැප නොවේ. කෙසේ නමුත් රජය, පාර්ලිමේන්තුව හා ජනාධිපතිවරයා හරහා ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබ තිබේ.*

- *කොමිසම ජාත්‍යන්තර බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙන් පිහිටුවන ලද්දක් වන බැවින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර බලපෑමේ ගොදුරු විය හැකි ය. එහෙයින් මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ කැපවීම එක්තරා දුරකට සැක සහිත ය.*

- *ව්‍යවස්ථාවෙහි එන අඩුපාඩු හා සුළුතර ප්‍රජාවන් විසින් මුහුණ දෙනු ලබන ප්‍රශ්නවලට අදාළව ඍජු, පැහැදිලි ප්‍රතිපත්ති හෝ පියවර දැකිය නොහැකි ය. කෙසේ වුව ද වෙනත් ඇතැම් ප්‍රශ්න සම්බන්ධයෙන් පැහැදිලි විසඳුම් සොයනු ලැබීමේ උත්සාහයක් තිබෙන බව අපට දකින්නට පුළුවන.*

- ආණ්ඩුවේ කැපවීම ගැන තමන් නොදන්නා බව හෝ විශ්වාසයක් තැබීම සැක සහිත බව පැවසූවෝ මෙසේ පැවසූහ.

- *නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුව කැප වෙනවා ද නැති ද යන්න මම නොදනිමි. එනමුදු සියලුම නිර්දේශ ක්‍රියාවට නැගීම අවශ්‍ය යයි මම විශ්වාස නොකරමි. හේතුව වන්නේ කොමිසම ඔවුන්ගේ වරමෙන් ඔබ්බට ගොස් තිබෙන නිසා ය.*

- *වාර්තාවේ ඇතැම් නිර්දේශ කෙටි කාලීන වන අතර ඇතැම් ඒවා දිගු කාලීන වේ. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමට නිර්දේශ ඉදිරිපත් කරන්නට නිදහස ප්‍රදානය කරන ලද්දේ යයි අපට කිව හැකි ය. ජනාධිපතිවරයා ඒවා ක්‍රියාත්මක කිරීමට බැඳී නැත. ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබ තිබේ. ඒවා ක්‍රියාවට නගනු ලබන්නේ ආණ්ඩුව හරහා ය, පාර්ලිමේන්තුව හරහා ය, විධායකය හරහා ය.*

*උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම එල්ටීටීඊය හා දමිළ ජාතිකවාදය ශ්‍රී ලංකාව මත ඇති කර තිබෙන සමාජ-ආර්ථික බලපෑම පිළිගෙන නොමැත.*

### *උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ සිතිවිලි*

පහතින් එන්නේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ අදහස් දැක්වූවන් සමහරෙකු විසින් සඳහන් කරන ලද සිතිවිලි සමහරකි.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හා එහි නිර්දේශ මේ දක්වා ආණ්ඩුව ගෙන තිබෙන එක් සාධනීය පියවරක් වන අතර වඩා හොඳ අනාගතයක් සඳහා මග විවෘත කරනු ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නංවනු ලැබීම රටේ පුරවැසියන්ට යහපතක් වනු ඇත.

- ජාතියක් ලෙස අප මුහුණ දෙන ප්‍රශ්න ඉන්දියානුවන් හෝ දකුණු අප්‍රිකානුවන් මුහුණ දෙන ප්‍රශ්න හා සමාන නොවේ. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව සිංහලයින් පිළිබඳව එක වචනයක්වත් සඳහන් කර නැත. වාර්තාව බටහිර ජාතීන් එල්ටීටීඊය ගොඩ නැගීමට ගත් උත්සාහයන් සඳහන් කරන්නේ ද නැත.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව සිවිල් සමාජය සඳහා ඉගැන්වීමේ උපකරණයක් විය යුතු ය. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම උසස් බුද්ධියකින් හා උසස් පදවි දැරූ පුද්ගලයන්ගෙන් සමන්විත විය. වාර්තාව මධ්‍යස්ථ

අදහස් අඩංගු කර ගනී. අපේ සමාජයේ මධ්‍යස්ථ පුද්ගලයන් සිටින්නේය යන කරුණ අගය කළ යුතු ය. මෙය සමාජයේ සැඟවී තිබෙන යම් කිසි දෙයකි. එය එළියට ගෙන ආ යුතු ය.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවෙහි රටේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳීමට සමීප කිසිවක් නොමැත. එහෙයින් ප්‍රයෝජනයක් නොමැති නිර්දේශ ගැන සාකච්ඡා කිරීමට කාලය ගන්නවා වෙනුවට රටේ දමිළ ජනයා විසින් මුහුණ දෙනු ලබන දුෂ්කරතා හා අසාධාරණත්වයට විසඳුම් සොයා ගැනීම හා සකච්ඡා කිරීම වඩා හොඳ ය.

- *සිංහල භාෂාව සම්බන්ධයෙන් ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳව දමිළ පුරවැසියන්ට ආධාර කිරීමට උතුර හා නැගෙනහිරෙන් පිටත ප්‍රදේශවල රජයේ කාර්යාලවලට පරිවර්තකයන් සැපයීම සඳහා වන නිර්දේශ වාර්තාවේ ඇත. කෙසේ වුව ද දමිළ භාෂාව උතුර හා නැගෙනහිර ආණ්ඩුවේ කාර්යාලවල පරිපාලන භාෂාව ය. එය එම ප්‍රදේශවල ජීවත්වන සිංහල ජනයාට දුෂ්කරතා ඇති කරන අතර මේ කාරණය සම්බන්ධයෙන් පරිවර්තකයන් සැපයීමට එහි නිර්දේශ කර නොමැත. තව ද* උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම දමිළ හා මුස්ලිම් අභ්‍යන්තර අවතැන් වූවන් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කළ ද සිංහල අභ්‍යන්තර අවතැන් වූවන් සම්බන්ධ කිසිදු තොරතුරක් සඳහන් නොකරයි. එසේම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවට බලය බෙදා හදා ගැනීම හා ස්වාධීන කොමිෂන් පිහිටුවීම වැනි එහි වරමට අදාළ නොවන නිර්දේශ ද ඇතුළත් කරයි.

- *මම පෞද්ගලිකව මෙය සාධාරණ වාර්තාවකැයි හඟිමි. අප දමිළ, මුස්ලිම් හා සිංහල ප්‍රජාවන් අතර ඒකසත්භාවය ශක්තිමත් කිරීම අවශ්‍ය ය. මෙම ජන වාර්ගික ප්‍රජාවන් අතර කිසිදු ආකාරයක බෙදීමක් සඳහා අවස්ථාවක් නොසැලසිය යුතු ය. තව ද* උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම දමිළ හා මුස්ලිම් අභ්‍යන්තර අවතැන් වූවන් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කළ ද සිංහල අභ්‍යන්තර අවතැන් වූවන් සම්බන්ධ කිසිදු තොරතුරක් සඳහන් නොකරයි.

- *යොමු කිරීම් අනුදේශ (TOR) මගින් බරපතල ලෙස සීමා කරනු ලැබ හා සාමාජිකයන්ගේ ආණ්ඩුවට ඇති සමීප පක්ෂපාතිත්වය තිබියදීත්* උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ අපක්ෂපාතී ය. කෙසේ වුව ද ඔවුහු බරපතල අත්හැරීමක්වන යුද අපරාධ පිළිබඳ තීරණාත්මක ප්‍රශ්නය අත්හැරීමට තීරණය කළ හ.

- *පූජකවරුන් 9 ගේ අතුරුදහන්වීම හා විශේෂයෙන්ම යුද්ධයෙන් පසු 2009 මැයිවල දී හමුදාවන්ට භාර වූ ද කඳවුරේ දී මිනිසුන් විසින් දැක ඇත්තා වූ හා දැන් අතුරුදහන් වී ඇත්තා වූ ද ගරු ෆ්‍රැන්සිස් ජෝසප් පියතුමා ගැන ද මම කතා කළෙමි. මම වින්දිතයන්ට වන්දි ගෙවන හා වැරදි සිදු කරන ලද්දන්ට ද දඬුවම් පමුණුවන ප්‍රතිෂ්ඨාපන යුක්තිය පිළිබඳ සංකල්පය ගැන කතා කළෙමි. එහෙත් මෙම නිර්දේශ අවසන් වාර්තාවේ දක්වා නොමැත. මගේ නිර්දේශ සමග මම ජාතික අර්බුදයට විසඳුමක් අපේක්ෂා කළෙමි.*

- *ආණ්ඩුව නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහිලා උනන්දුවක් දක්වන්නේ නැති වුව ද රාජ්‍ය නොවන සංවිධාන මේවා බිම් මට්ටමට ගෙන යා යුතුව තිබේ. එසේම මට ආගමික නායකයින් ද ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමෙහිලා උනන්දුවක් දක්වන බව දකින්නට නොමැති අතර ඔවුන් ක්‍රියා මාර්ගයට පිවිසෙන සේ ඔවුන්ව උනන්දු කරනු ලැබීම අවශ්‍ය ය.*

- *උගත් පාඩම් කොමිසමේ නිර්දේශයන් ආරම්භක ස්ථානයකි. එමගින් ශ්‍රී ලංකාව වැරදි නිවැරදි කරගැනීමට සූදානම් බව ජාත්‍යන්තර ප්‍රජාවට පෙන්නුම් කරනු ඇත. මාගේ සාක්ෂියෙහිදී ආගමික නොඉවසීම පිළිබඳව වූ ප්‍රශ්නය මම ඉස්මතු කළෙමි. අද මෙය පෙරමුණටම පැමිණ ඇත. මෙම ප්‍රශ්නය බෙහෙවින් විවේචනාත්මක ලෙස සලකා බැලීම වැදගත් ය. එසේ නැතිනම් එහි ප්‍රතිඵලය 2009 දී අවසන් වූ වසර 30ක යුද්ධයට වඩා වැඩිවනු ඇත.*

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ කොමසාරිස්වරුන් ඔවුන් පත් කරන ලද දූත මෙහෙවර මුදුන්පත් කරනු සඳහා පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් සිය ප්‍රතිරූපය රැක ගැනීම සඳහා සහ දැන් ප්‍රතිසංස්කරණය වූ රාජ්‍යයක් ලෙස පිළි ගැනීමක් ලබා ගැනීම සඳහා *ශ්‍රී ලංකාවට* රාමුවක් හා ක්‍රමෝපායක් සකස් කර තිබේ. කෙසේ වුව ද නායකයින් මේ වන විට ඔවුන්ගේ මෝඩ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමෝපාය මගින් මෙම අවස්ථාව අහිමි කරගෙන තිබේ.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම සමස්තයක් වශයෙන් සමාජය විශේෂයෙන් සිංහල ප්‍රභූන් දමිළ සටන්කාමිත්වය සඳහා යම් දුරකට වගකිව යුතු වූයේ ය යන අදහස ජනනය

කරනු දැකීම මට වුවමනා විය. ජවිපෙහි පුනරුත්ථාපනයට හා අපේ සමාජය තුළට සිංහල ගැමි තරුණයා විශාල වශයෙන් අන්තර්ග්‍රහණය කර ගැනීමට මග පෑදුණේ එම සාමූහික දෝෂ සහිත බවේ හැඟීම තුළිනි. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවෙන් පසු එවැනි පුළුල් සමාජ වගකීමක් පිළිබඳ හැඟීමක් ඇත්තේ නැති (නැතහොත් ඇත්තේ ඉතා සුළු හැඟීමක් වන) අතර  දමිළ ජනයා දිගටම පිටස්තර බවේ හැඟීම් ඇතිව සිටිති.

- *උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම විශේෂයෙන් ස්ථාපිත කරන ලද සමගිසන්ධානය හා සාමය අප මග හැර යන බව පෙනේ. පවතින තත්ත්වය වසර 30 ක කාලය තුළ පැවති තත්ත්වයට වඩා හොඳ යයි කීම අසීරු ය. එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය රාජ්‍ය සමාව ලද (නොඑසේ නම් අනුග්‍රහ ලද) ත්‍රස්තවාදය විසින් විතැන් කරනු ලැබ තිබේ යයි විශ්වාස කිරීම සම්බන්ධයෙන් කෙනෙකුට දොස් පැවරිය නොහැකි ය. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ අන්තර් වාර වාර්තාවෙහි අඩංගු විශේෂිත නිර්දේශ පිළිබඳව කිසිදු අර්ථවත් පියවරක් ගනු ලැබ නැත. එහි අවසාන නිර්දේශ සම්බන්ධයෙන් ඊට වෙනස් ආකාරයකින් ක්‍රියා කරනු ඇත් දැ යි උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම  අවංකව විශ්වාස කළේ ද?*
- *මෙම වාර්තාව ලියා ඇත්තේ දෙමළ ජාතිකවාදී දෘෂ්ඨිමය පර්යාලෝකයකිනි.*


# IV

## උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ වැඩමුළු සහභාගිත්ව සමීක්ෂණය

පහතින් එන්නේ දිස්ත්‍රික් 25 ක වැඩමුළු සහභාගියන් 1500 ක අදහස් ය.

| | |
|---|---|
| වයස 21 අඩු : | 11.3% |
| වයස 21 - 35: | 39.6% |
| වයස 36 - 50: | 31.7% |
| වයස 51 - 65: | 14.3% |
| වයස 65 වැඩි: | 3.1% |


***මෙම වැඩමුළුවට පෙර උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම කෙරෙහි ඔබගේ උනන්දුව හොඳටම පැහැදිලි කරන ප්‍රකාශය පහත ප්‍රකාශ අතරින් කුමක් ද ?***



වැඩමුළුවට පෙර සහභාගිකයන්ගෙන් බහුතරයකට (44.4%) උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම කෙරෙහි තිබුණේ සුළු උනන්දුවක් වන අතර 24.9% ක් පැවසුවේ ඔවුන්ට විශාල උනන්දුවක් තිබූ බව යි.

දිස්ත්‍රික් වශයෙන් ගත් කල  උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම කෙරෙහි විශාල උනන්දුවකින් යුතු වූ වැඩමුළු සහභාගිකයන් වූයේ කිලිනොච්චිය (43.3%), මන්නාරම (55%), හා මුලතිව් (55%), යන දිස්ත්‍රික්කවල ය.  පහතින් එන දිස්ත්‍රික්කවල සහභාගිකයන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් කියා සිටියේ ගම්පහ (56.7%), කළුතර (56.7%), හා මාතලේ (46.7%) වැඩමුළුවට පෙර ඔවුන්ට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම කෙරෙහි කිසිදු උනන්දුවක් නොතිබූ බව ය.

***උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ආණ්ඩුවේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත් නොවන බව ඇතැම්හු කියති. ඔබ එකඟ වන්නේ ද?***




**උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ අවසාන වාර්තාවේ නිර්දේශවලට[1] ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව 2012 ජූලිවල දී *'උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ජාතික ක්‍රියා සැලැස්මක්* නිකුත් කළේ ය. ක්‍රියා සැලැස්ම ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය, මානව හිමිකම්, ඉඩම් ආපසු දීම හා නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්ථාපනය/වන්දි සහන හා *සමගිසන්ධානය* යන තේමා පහ යටතේ වර්ගීකරණය කරනු ලැබ තිබේ. තෝරා ගනු ලැබ තිබෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ තොරතුරුවලට ක්‍රියාකාරකම්, ප්‍රධාන වගකිව යුතු ආයතනය, ප්‍රධාන කාර්ය සාධක දර්ශකය හා එක් එක් කාර්ය සඳහා කාල රාමුව ඇතුළත් වේ.**

වැඩමුළු සහභාගිකයන්ගෙන් බහුතරය උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ආණ්ඩුවේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත් නොවේ යයි විශ්වාස කරති. සම්පූර්ණයෙන්ම වගේ 30% ප්‍රකාශ කරන්නේ ඔවුන් එය ප්‍රමාණවත් නොවේ ය යන්නට මුළුමනින්ම එකඟ වන බව ය.

ක්‍රියා සැලැස්ම පිළිබඳ අඩුම විශ්වාසයකින් යුත් සහභාගිකයන් මන්නාරම (73.3%), ගම්පහ (55%), කිලිනොච්චිය (51.7%) යන දිස්ත්‍රික්කවලින් පැමිණි අතර අම්පාර, මාතර හා පුත්තලම් යන දිස්ත්‍රික්කවල 20% පමණ සහභාගිකයන් ප්‍රකාශ කළේ ජාතික ක්‍රියා සැලැස්ම ප්‍රමාණවත් නොවේ යන ප්‍රකාශනය සමග ඔවුන් එකඟ නොවන බව ය.

[1] http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca201207/National%20Plan%20of%20Action%20_%20LLRC.pdf


**උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය සම්පූර්ණයෙන්ම කැපවී සිටිනවා යැයි ඔබ හිතනවාද?**




50% ක්ම වාගේ වැඩමුළු සහභාගිකයෝ ආණ්ඩුව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සම්පූර්ණ වශයෙන් කැප වන්නේ යයි විශ්වාස නොකරති. ඔවුන් එසේ සිතන්නේ මන්දැයි විමසූ විට පිළිතුරු දුන්නවුන් හේතු ලෙස දැක් වූයේ අවසාන වාර්තාවේ පරිවර්තන සිංහලෙන් හා දෙමළෙන් ලබා ගැනීමට සලස්වා නොතිබීම, නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබීමේ ප්‍රත්‍යක්ෂ සාක්ෂි නොමැතිවීම හා ආණ්ඩුව විසින් පත් කරන ලද කොමිසම් හා වාර්තා කෙරෙහි වන විශ්වාසයේ පොදු අඩුව වැනි හේතූන් ය.

දිස්ත්‍රික්ක මට්ටමින් අදහස් දෙස බැලීමේ දී මන්නාරම් දිස්ත්‍රික්කයේ 88.3%ක් ආණ්ඩුව නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සම්පූර්ණ වශයෙන් කැප වේ යයි නොසිතන අතර කිලිනොච්චියේ 82.7% ක් ද නුවරඑළියේ 70% ක් ද ඒ සමග එකඟ වෙති. ආණ්ඩුව නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කැප වේ යයි සිතන්නන්ගේ ඉහළම ප්‍රතිශතයන් ආවේ ත්‍රිකුණාමලය (28.3%), මොනරාගල (25%) හා කෑගල්ල (23.3%) යන දිස්ත්‍රික්කවලිනි.

**නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ යථාර්ථවත් කාල පරිච්ඡේදයක් ලෙස ඔබ සිතන්නේ කුමක් ද?**




වැඩමුළු සහභාගිකයෝ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව යථාවාදී කාල පරිච්ඡේදයක් පිළිබඳව සාධාරණව බෙදී ගියහ. 20% ක් පමණ කීවේ වසරකට අඩු කාලයක් ප්‍රමාණවත් බව ය. 21.6% ක් වසර එක සිට දෙක දක්වා ද තවත් 20% ක් වසර දෙක සිට පහ දක්වා ද ප්‍රමාණවත් බව පැවසූහ.

මන්නාරමේ වැඩමුළු සහභාගිකයන්ගෙන් 36.7% ක් මාස හයකට අඩු කාලයක් ද තවත් 35% ක් වසරක කාලයක් ද ප්‍රමාණවත් බව පැවසූ අතර මොනරාගල සහභාගිකයන් 36.7% වසර එක සිට දෙකක කාලයක් ද මහනුවර දිස්ත්‍රික්කයේ සහභාගිකයන් පැමිණි 46.7% ක් වසර දෙක සිට පහක කාලයක් ද රත්නපුරේ සහභාගිකයන් 66.7% ක් වසර පහකට වැඩි කාලයක් ද ලබා දිය යුතු බව පැවසූහ.

# V

## ඇමුණුම්

### LLRC කොමිසම වෙත සාක්ෂි ලබාදුන් පුද්ගලයන්ට යොමු කරනු ලබන ප්‍රශ්නාවලිය

D1 වයස : ........................................................................

D2 ස්ත්‍රී / පුරුෂ : ........................................................................

D3 පදිංචි දිස්ත්‍රික්කය : ........................................................................

1. වර්තමාන සමාජයේ දැනට මුහුණ දෙන උග්‍ර ගැටලු තුනක් සඳහන් කරන්න.

a.......................................................................................................

.......................................................................................................

b.......................................................................................................

.......................................................................................................

c.......................................................................................................

.......................................................................................................

2. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ පරමාර්ථය, ඔබ සිතන පරිදි කුමක් වන්නට ඇතිද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

3. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම ගැන ඔබ මුලින්ම දැන ගත්තේ කෙසේද?

a. මාධ්‍ය මගින්

b. පවුලේ සාමාජිකයකුගෙන් / මිතුරු කෙනෙකුගෙන්

c. රාජ්‍ය නොවන සංවිධානයකින් / පොදුජන කණ්ඩායමකින්

d. වෙනත් මාර්ගයකින් (සඳහන් කරන්න)

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

4. ඔබ LLRC කොමිසම හා වාර්තාව ගැන පුවත් හා අලුත් තොරතුරු ලබාගත් මූලික මාර්ගය කුමක්ද? (මාධ්‍යයන්ගෙන් නම් කරුණාකර එම පුවත් පත්වල, රූපවාහිනී හා ගුවන් විදුලි නාලිකාවල නම් සඳහන් කරන්න)

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

5. LLRC අවසාන වාර්තාව ප්‍රසිද්ධ කර ඇති බව ඔබ දන්නවාද?

a. ඔව්

b. නැහැ

6. ඔබ එකඟ වන්නේ පහත සඳහන් කවර ප්‍රකාශයටද?

a. LLRC වාර්තාව මුළුමණින් ම නැත්නම් එහි වැඩි කොටසක් කියවීමි.

b. LLRC වාර්තාව තුළ අඩංගු දේ ගැන මුළුමණින්ම හෝ වැඩි කොටසක් පොත් පිංචකින් නැත්නම් වෙනත් ලේඛනයකින් කියවීමි.

c. LLRC වාර්තාවේ මට අදාළ හෝ වැදගත්වන කොටස් පමණක් කියැවීමි.

d. LLRC වාර්තාව ගැන පළවූ පොත් පිංචකින් හෝ ලේඛණයකින් මට අදාළ හෝ වැදගත් වන කොටස් පමණක් කියැවීමි

e. මා LLRC වාර්තාව කියවා නැත. එහෙත් එහි මට අදාළ කොටස් / මට වැදගත්කමක් ඇති කොටස් වෙනත් අයගෙන් / ජනමාධ්‍යයන්ගෙන් දැන ගතිමි. (8 වන ප්‍රශ්නය බලන්න.)

f. LLRC වාර්තාව මා කියවා නැත. එහෙත් එහි අන්තර්ගතය වෙනත් අයගෙන් / මාධ්‍යයෙන් දැනගතිමි. (8 වැනි ප්‍රශ්නය බලන්න.)

g. LLRC වාර්තාවේ අඩංගු කරුණු ගැන මම කිසිවක් නොදනිමි. (8 වැනි ප්‍රශ්නය බලන්න.)

7. LLRC වාර්තාව, LLRC පිළිබඳවූ පොත් පිංචක් හෝ ලේඛනයක්, ඔබට ලැබුණේ කොහෙන් ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

8. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමට විස්තර සාක්ෂි ලබාදීමේ දී ඔබ බලාපොරොත්තු වූයේ කුමක්ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

9. මෙම LLRC අවසන් වාර්තාව ඔබේ එම බලාපොරොත්තු සපුරනවාද?

   a. ඔව්

   b. නැහැ

   c. මම එහි අඩංගු දේ ගැන නොදනිමි

10. LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සම්පූර්ණයෙන් කැපවී සිටිනවා යයි ඔබට සිතේද?

   a. ඔව්

   b. නැහැ

   c. නොදනිමි / ස්ථිර ලෙස කිව නොහැකිය.

11. කරුණාකර ඔබ 10 වැනි ප්‍රශ්නයට දුන් පිළිතුර ගැන පැහැදිලි කිරීමක් කරන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

12. LLRC නිර්දේශ ගැන ඔබේ අදහස කුමක්ද? (එකකට වඩා තෝරාගත හැකි ය.)

a. ඒවා ක්‍රියාත්මක කළ හැකි ය.
b. සමහර නිර්දේශ එතරම් යථාර්ථවත් නොවේ.
c. මගේ බලාපොරොත්තු ඉක්මවා යයි.
d. මා අපේක්ෂා කළ තරමට වඩා අඩු ය.
e. ඉතා උග්‍ර ගැටලු කිහිපයක් එහි ඇතුලත් නොවේ / එයින් ආමන්ත්‍රණය කර නොමැති හෝ ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රනය කර නොමැත.
f. මෙයින් සමහර නිර්දේශ පමණක් ක්‍රියාත්මක කළ යුතු ය.
g. නිර්දේශ මොනවාදැයි මම නොදනිමි.

13. කරුණාකර ඉහත 12 වැනි ප්‍රශ්නයට ඔබ දුන් පිළිතුර ගැන කෙටි විස්තරයක් කරන්න?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

14. LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව ඉදිරිපත් කර ඇති ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත් නොවන බව සමහරු කියති. ඔබ ඊට එකඟද?

a. සම්පූර්ණයෙන් එකඟයි

b. යම්තාක් දුරට එකඟ වෙමි

c. එකඟ වෙන්නෙත් නෑ / නොවෙන්නෙත් නෑ

d. යම්තාක් දුරට එකඟ නොවෙමි

e. සම්පූර්ණයෙන් එකඟ නොවෙමි

f. මම රජයේ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව දැනුවත් නැත

15. LLRC ගැන ඔබට වෙනත් විවේචනාත්මක අදහස් ඇත්නම් ඒවා පහත සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

# LLRC වැඩමුළුවට සහභාගී වූවන් සඳහා ප්‍රශ්නාවලිය

D1 වයස : ..........................................................................

D2 පදිංචි දිස්ත්‍රික්කය : ..........................................................................

D3 රැකියාව : ..........................................................................

1. මෙම වැඩමුළුවට පෙර, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ නිර්දේශ කෙරෙහි ඔබට තිබුණු උනන්දුව වඩා හොඳින් පළවන්නේ පහත සඳහන් කවර ප්‍රකාශයන්ද?

   a. දැඩි උනන්දුවක් b. සුළු උනන්දුවක් c. කිසිම උනන්දුවක් නොතිබිණි

2. LLRC නිර්දේශ ගැන ඔබේ අදහස කුමක්ද? (එකකට වඩා තෝරාගත හැකි ය.)

   a. ඒවා ක්‍රියාත්මක කළ හැකිය.
   b. සමහර නිර්දේශ යථාර්ථවාදී නොවේ.
   c. මගේ බලාපොරොත්තු ඉක්මවා ගොස් ඇත.
   d. මා බලාපොරොත්තු වූ තරමට අඩුය.
   e. ඒවා සමහර උග්‍ර ගැටළු කෙරෙහි යොමු වී නැත / නැත්නම් යොමුවීම ප්‍රමාණවත් නැත.
   f. නිර්දේශවලින් කීපයක් පමණක් ක්‍රියාත්මක කළ යුතු ය.

g. LLRC නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු නැත.

h. මා LLRC නිර්දේශ ගැන දැන සිටියේ නැත.

i . මම නොදනිමි / නිශ්චිත නැත.

3. ඉහත (2 වැනි) ප්‍රශ්නයට ඔබ දුන් පිළිතුර ගැන කෙටි විස්තරයක් දෙන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

4. LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ආණ්ඩුවේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත් නොවේ යැයි සමහරු කියති. ඔබ ඊට එකඟ වෙනවාද?

a. සම්පූර්ණයෙන්ම එකඟයි.

b. තරමක් එකඟයි.

c. එකඟවීමක් හෝ එකඟ නොවීමක් යන දෙකම නැත.

d. තරමකට එකඟ නැත.

e. සම්පූර්ණයෙන් ම එකඟ නැත.

f. ආණ්ඩුවේ ක්‍රියාකාරී සැලැස්මක් ගැන මම නොදනිමි.

5. LLRC වාර්තාවේ ඉතාම වැදගත් නිර්දේශය, ඔබ සිතන පරිදි කුමක්ද?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

6. LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව මුළුමණින් ම කැප වී ඇතැයි ඔබ සිතනවාද?

a. ඔව් b. නැහැ c. නොදනිමි/නිශ්චිත අදහසක් නැහැ

7. ඉහත 6 වැනි ප්‍රශ්නයට දුන් ඔබේ පිළිතුර ගැන කෙටි පැහැදිලි කිරීමක් කළ හැකිද?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

8. ඔබ සිතන පරිදි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු සැබෑ කාල පරාසය කුමක්ද?

a. හය මාසයකට අඩු කාලයකින්

b. අවුරුද්දකට අඩු කාලයකින්

c. අවුරුද්දකින් හෝ දෙකකින්

d. අවුරුදු දෙකේ සිට පහ දක්වා කාලයකින්

e. අවුරුදු පහකට වැඩි කාලයකින්

9. පහත සඳහන් ප්‍රකාශ LLRC වාර්තාව පරිවර්තනය කිරීම සම්බන්ධයෙනි. ඔබ වඩාත් එකඟවන ප්‍රකාශය තෝරන්න.

a. LLRC වාර්තාවේ සිංහල සහ දෙමළ පරිවර්තන ආණ්ඩුව විසින් 2011 දෙසැම්බර්හි දී නිකුත් කරන ලදි.

b. LLRC වාර්තාවේ සිංහල සහ දෙමළ පරිවර්තන, ඉංග්‍රීසි වාර්තාව නිකුත් කොට මාසයකට පසු නිකුත් කරන ලදි.

c. LLRC වාර්තාවේ සිංහල සහ දෙමළ පරිවර්තන නිකුත් කරන ලද්දේ ඉංග්‍රිසි වාර්තාව නිකුත් වී හය මාසයකට පසු ය.

d. LLRC වාර්තාවේ සිංහල සහ දෙමළ පරිවර්තන නිකුත් වූයේ ඉංග්‍රීසි වාර්තාව නිකුත් වී මාස අටකට පසු ය.

e. LLRC වාර්තාව සිංහල සහ දෙමළ පරිවර්තන ආණ්ඩුව විසින් නිකුත් කරන ලද්දේ, ඉංග්‍රීසි වාර්තාව නිකුත් වී අවුරුද්දකට පසුය.

f. LLRC වාර්තාවේ සිංහල සහ දෙමළ පරිවර්තන ආණ්ඩුව විසින් තවමත් නිකුත් කොට නැත.

g. නොදනිමි / නිශ්චිත අදහසක් නැත.

10. LLRC වාර්තාව ගැන වැඩිදුරටත් ඔබට අදහසක් ඇත්නම් පහත සඳහන් කරන්න.





ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් - 5A, ස්ටෝර්ක් පෙදෙස, කොළඹ 10. දු.ක: 0777-315971

ISBN : 978-955-4746-04-6